**කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය - 2023 ජනවාරි 01 සිට 2023 පෙබරවාරි 28 දින දක්වා**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ 2023 පෙබරවාරි 28 දිනට වූ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 ජනවාරි 01 සිට 2023 පෙබරවාරි 28 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 ජනවාරි 01 සිට 2023 පෙබරවාරි 28 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා වූ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් මාස දෙක සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 අවධාරණය කළ යුතු කරුණු**

ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ සටහන් අංක 1.7 හි දක්වා ඇති පරිදි දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය 2023 මාර්තු 01 දින සිට කොළඹ විශ්වවිද්‍යාලයේ පීඨයක් බවට පත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සහ අධ්‍යාපන අමාත්‍යවරයාගේ අනුමැතිය හා නිර්දේශ සහිතව 2023 පෙබරවාරි 13 දිනැති අංක 2319/22 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පල කර ඇත.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ආයතනයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය

විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව වක්‍ර ක්‍රමයට සකස් කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි ආයෝජන ක්‍රියාකාරකම් යටතේ වර්ෂය තුලදී භාණ්ඩ විකිණීමෙන් ලැබී තිබුණු රු.28,628 ක් සටහන් කර නොතිබුණු අතර සමාලෝචිත කාලපරිච්ඡේදයට අදාලව ලැබිය යුතු රු.673,848 ක පොළිය මුදලින් ලැබුණු පොලිය ලෙස සටහන් කර තිබුණි. එසේම කාරක ප්‍රාග්ධන ගැලපීම් යටතේ පෙර ගෙවීම් ලෙස ගැලපිය යුතු අගය ශූන්‍ය වුවත් රු.629,957 ක අගයක් සටහන් කර තිබුණි. | අඩුපාඩු නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන බව. | ගිණුම්කරණ ප්‍රමිත අනුව නිවැරදිව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කලයුතුය. |
| (ආ) | වසර 24 ක කාලයක සිට දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ශිෂ්‍ය නේවාසිකාගාරය පවත්වාගෙන යන වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අයත් ගොඩනැගිලි සහිත හෙක්ටර්යාර 0.1765 ක ඉඩම ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 14 ඡේදය අනුව පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. එසේම එහි පවතින වර්ග 3කට අදාළ ස්ථාවර වත්කම් අයිතම 158ක් අගය කර | නිදහස් දීමනා පත්‍රයක් මගින් දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය වෙත පවරා දීමට වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් අනුමැතිය හා ඉඩම පවරාදීමට 2022.03.09 දින බස්නාහිර පළාත් ගරු ආණ්ඩුකාරතුමා එකගතාවය ලබා දී ඇති බවත් ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු කරගෙන යනු ලබන බව. | මෙහෙයුම් කටයුතු සඳහා භාවිතා කරන වත්කම් සියල්ල ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 14 ඡේදය අනුව |

| | | | |
|---|---|---|---|
| | කාර්යාල උපකරණ යටතේ ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | | ගිණුම්ගත කල යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 65 ඡේදය අනුව දේපල පිරියත උපකරණ වල අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් 2023 පෙබරවාරි 28 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ධාරණ අගය ශූන්‍ය වූ පිරිවැය රු.33,080,665 ක්වූ පුස්තකාල පොත් තවදුරටත් භාවිතයේ පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 7 හි 44 ඡේදය පරිදි වටිනාකම තීරණය කිරීමට අපහසු වත්කමක් වන පුස්තකාල පොත්වල වටිනාකම තීරණය කිරීම හෝ ඵලදායී ජීවිත කාලය තීරණය කිරීම ඉතාමත් අපහසු ප්‍රායෝගික නොවන බැවින් ඒවා ප්‍රත්‍යාගණනය කිරීමට හෝ ගිණුම් ප්‍රකාශන වල සටහන් මඟින් හෙළිදරව් කිරීමට කටයුතු කල යුතු බව 2019 විගණන වාර්තාවේ සඳහන්ව ඇත. 2022 දී සම්පූර්ණයෙන් ක්ෂය වී ඇති පුස්තකාල පොත් වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කර ඇත. ඉදිරියේදී පුස්තකාල පොත් ප්‍රත්‍යාගණනය අනෙකුත් විශ්වවිද්‍යාල වල ක්‍රියාත්මක වන ක්‍රමවේදය සොයා බලා ඒ අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දී ඇති බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07හි 65 ඡේදය අනුව දේපල පිරියත උපකරණ වල අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය කල යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 හි 12 හා 93 ඡේද අනුව වාර්ථාකරණ අස්ථිත්වය ට ලැබුණ සහ ලැබියයුතු ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතාවල දළ ගලා ඒම් සියල්ල අයභාර ලෙස හඳුනාගත යුතු වුවද 2023 පෙබරවාරි 01 දින ලැබී තිබුණු රු.3,050,000ක පර්යේෂණ ප්‍රදාන ආයතනයේ අයභාරයක් ලෙස ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | මහාචාර්ය වෛද්‍ය හැරපත්දෙනිය මියට පර්යේෂණයක් සඳහා ලද මෙම මුදල ආයතනයේ අදායමක් ලෙස ගෙන නොමැත. ජනවාරි සහ පෙබරවාරි මාස දෙක තුල මෙම මුදලින් වියදම් කර නොමැත. ඉදිරියේදී විගණනය විසින් පෙන්වා දී ඇති පරිදි කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 11 අනුව අයභාර ලෙස හඳුනාගත යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 20 හි 118 ඡේදය ප්‍රකාරව පිරිවැය රු.5,339,763 ක්වූ අස්පෘශ්‍ය වත්කම් වෙනම වත්කම් පන්තියක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්වීම වෙනුවට පරිගණක හා මුද්‍රණ යන්ත්‍ර යටතේ දක්වා තිබුණි. | මේ වන විට අස්පෘශ්‍ය වත්කම් වෙනම වත්කම් පන්තියක් ලෙස ස්ථාවර වත්කම් ලේඛණයට ඇතුළත් කර ඇති අතර ඉදිරියේදී වෙනම වත්කම් පන්තියක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල පෙන්වීමට කටයුතු කරනු ලබන බව. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අනුව ගිණුම් තැබීම් සිදුකල යුතුය. |

### 1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 ජනවාරි 01 සිට 2023 පෙබරවාරි 28 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු එකතුව රු.3,508,314 ක් වූ වියදම් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | විගණනය විසින් ඉදිරිපත් කර ඇති ලේඛනයේ වටිනාකම් අතුරින් රු.3,722,760 ක වටිනාකම් උපචිත ලේඛනයට ඇතුළත් කර ඇති බව. | කාලපරිච්ඡේදයට අදාල සියලු වියදම් ගිණුම්ගත කලයුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ආයෝජන සඳහා ලැබුණු බැංකු සනාථකිරීම් අනුව, 2023 පෙබරවාරි 28 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ලැබිය යුතු ආයෝජන පොලී රු.518,610 කින් වැඩියෙන්ද මුදල් ශේෂය රු.565,556 කින් අඩුවෙන්ද, මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආයෝජන පොලී ආදායම් රු.46,945 ක් අඩුවෙන් ද පෙන්වා තිබුණි. | ආයෝජන සම්බන්ධයෙන් පෙන්වා ඇති කරුණු සම්බන්ධයෙන් එකග වේ.2023.12.31 ගිණුම්වලට නිවැරදි අගයන් ලබාදීමට කටයුතු කරනු ලබන බව. | ආයෝජන පොලී ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කලයුතුය. |

**1.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.7.1 ගෙවිය යුතු මුදල්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 හා 2021 වර්ෂවලට අදාල විභාග රාජකාරි සඳහා ගෙවිය යුතු රු.81,785 ක් විගණිත දින වූ 2023 දෙසැම්බර් 07 දින දක්වාම නිරවුල් කර නොතිබුණි. | නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | ගෙවිය යුතු ශේෂ කඩිනමින් නිරවුල් කලයුතුය. |

**1.8 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) | මුදල් රෙගුලාසි 396 | ගෙවීමට ඉදිරිපත් නොකල එකතුව රු.76,651 ක්වූ අවලංගු චෙක්පත් 26 සම්බන්ධව යොමුගත මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මු.රෙ. 394 අනුව චෙක්පත් අවලංගු කරන්නේ එම චෙක්පත වෙනුවට වෙනත් චෙක්පතක් නිකුත් නොකරන්නේ නම් පමණි. අදාළ චෙක්පත් අවලංගු කර ඇත්තේ මු.රෙ. 396 පරිදි වේ. එනම් නැවත ඉල්ලීම් කළහොත් ගෙවීම සඳහා තාවකාලික රැඳවුම් ගිණුමක් ලෙස චෙක්පත අවලංගු කිරීම් ගිණුමේ තබාගෙන ඇත. | කල් ඉකුත් වූ ගෙවීමට ඉදිරිපත් නොකල චෙක්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396 පරිදි කටයුතු කලයුතුය. |
| (ii) | මුදල් රෙගුලාසි 772 හා වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/ 2022 හා 2022 සැප්තැම්බර් 09 දිනැති චක්‍රලේඛය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලින් හඳුනාගත් විෂමතා හා අපහරණ කටයුතු කඩිනමින් සිදුකල යුතු වුවත් 2021 හා 2022 වර්ෂවල සිදුකර තිබුණු භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල විෂමතා හා අපහරණවලට අදාල | මුදල් රෙගුලාසි 772 හා 2022.09.09 දිනැති වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 10/2022 අනුව ඉහත 2020 හා 2021 දී අබලි භාණ්ඩ වශයෙන් හඳුනාගත් ද්‍රව්‍ය අපහරණ කිරීම සඳහා රජයේ කර්මාන්තශාලාව සහ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව සමඟ කටයුතු කරන ලදී. මෙම භාණ්ඩ | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණවලින් හඳුනාගත් විෂමතා පිළිබඳ කටයුතු හා අපහරණ කටයුතු කඩිනමින් සිදුකල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි. | අපහරණය කර ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා අවශ්‍ය වන තාක්ෂණය එම දෙපාර්තමේන්තුව සතුව නොමැති බව අප වෙත 2023.02.27 දිනැති ලිපිය මඟින් දන්වන ලදී. අදාළ භාණ්ඩ අපහරණය කිරීමට කටයුතු කරනු ලබන බව. | |
| (iii) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 3 වන උපලේඛණය හා 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | ස්ථාවර වත්කම් ලේඛනය අභ්‍යන්තර පාලන උපකරණයක් ලෙස යොදාගත හැකි පරිදි යොමුගත රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගත යුතු වුවත්, ඊට පටහැනි ලෙස එක් එක් වර්ෂ සඳහා වෙන වෙනම ලේඛනයක් පවත්වාගෙන තිබුණු අතර ඉඩම්වල විස්තර ඊට ඇතුලත් කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛණය මෘදුකාංග පද්ධතියක් හරහා සිදුකරනු ලබයි. ඒ ඒ වර්ෂවලදී විගණනයට ඉදිරිපත් කිරීම සඳහා මුද්‍රණ පිටපත් ලබාගෙන ඇත. ඉඩම්වල විස්තරද ඒ සමග ඇතුලත් කර ඇති බව. | ස්ථාවර වත්කම් ලේඛනය අභ්‍යන්තර පාලන උපකරණයක් ලෙස යොදාගත හැකි පරිදි යොමුගත රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගත යුතුය. |
| (ආ) | **චක්‍රලේඛ** | | | |
| (i) | 2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/21 4/19/2023 දරන භාණ්ඩාගාර ලේකම් විසින් අධ්‍යාපන ලේකම් ඇමතූ චක්‍රලේඛ ලිපිය | බැඳුම්කර උල්ලංඝනය කිරීම් මත අයකර ගන්නා මුදල් ලද සැණින් රාජ්‍ය ආදායමට බැරකල යුතු වුවත් ඊට පටහැනි ලෙස බැඳුම්කර උල්ලංඝනය කිරීම් මත අයකර ගත් රු. 4,230,939 ක මුදල් කමිටුවේ අනුමැතිය මත ස්ථාවර තැන්පතුවක ආයෝජනය කර තිබුණි. | විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 737 අනුව කටයුතු කර ඇත. | යොමුගත චක්‍රලේඛ ලිපිය අනුව බැඳුම්කර උල්ලංඝනය කිරීම් මත අයකර ගන්නා මුදල් ලද සැණින් රාජ්‍ය ආදායමට බැරකල යුතුය. |
| (ii) | 2018 මාර්තු 19 දිනැති අංක 01/ 2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | 2021 වර්ෂයේදී වාහන විකිණීමෙන් ලැබී තිබුණු රු.1,327,500 ක් භාණ්ඩාගාරය වෙත යැවීමට කටයුතු කර නොතිබුණි. | 2022.01.24 දින පැවති 486 වන කළමනාකරණ මණ්ඩල රැස්වීමේදී දේශීය වෛද්‍ය විද්‍යා ආයතනය වෙනම පනතකින් පිහිට වූ ස්වාධීන ආයතනයක් හේතුවෙන් මෝටර් රථ විකුණුම් මුදල ආයතනයේ අරමුදලට එකතු කර භාවිතයට ගැනීම සුදුසු බව කළමනාකරණ මණ්ඩලය තීරණය කරන ලද බව. | යොමුගත චක්‍රලේඛය අනුව වාහන විකිණීමෙන් ලැබුණු මුදල් භාණ්ඩාගාරය වෙත යැවිය යුතුය. |

### 1.9 මුදල් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය විසින් පවත්වා ගෙන එනු ලැබූ බැංකු ජංගම ගිණුම් 04 ක පැවති අතිරික්ත මුදල් "Money Market" ආයෝජන ගිණුම යටතේ Over Night Deposit යටතේ 2019 සැප්තැම්බර් 17 දින සිට ආයෝජනය කර 2023 පෙබරවාරි 28 දින වන විට එකතුව රු.7,463,524.73 ක පොලියක් උපයාගෙන තිබුණු අතර එදිනට එම ආයෝජන ගිණුමේ (බැංකු සනාථන අනුව) රු.22,718,252 වාසිදායක ශේෂයක් පැවතුණි. මෙම ආයෝජන සැලසුම් සඳහා 2020 ජූලි 30 දින ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඉල්ලා තිබුණද විගණන දිනය වූ 2023 මැයි 22 දින දක්වා ඒ සඳහා අනුමැතිය ලැබී නොතිබුණි. | අතිරික්ත මුදල් ආයෝජන ගිණුමේ රු. 22,718,252 ලෙස වාසිදායක ශේෂයක් ලෙස දක්වා ඇත්තේ බැංකු ගිණුම් හතරෙන්ම ආයෝජනය වූ මුදල්ද සමගිනි. | රජයේ අරමුදල් ආයෝජනය කිරීම සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබා ගතයුතුය. |
| (ආ) | ආයතනය සතු ඉඩමකින් පර්චස් 10.08 ක කොටසක් 2014 වර්ෂයේ පෞද්ගලික ආයතනයකට විකුණා ලබාගත් මුදල්, 2013 ජූනි 19 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව දේශීය වෛද්‍ය ආයතනයට මාරු කිරීමට පමණක් අනුමත කර තිබුණි. ඒ අනුව මාසික මුදල් අවශ්‍යතාවය සඳහා එම මුදල් යොදවා ගත යුතුව තිබියදී ආයතනයේ මුදල් කමිටුවේ අනුමැතිය මත ස්ථාවර තැන්පතු දෙකක ආයෝජනය කර තිබුණු අතර 2023 පෙබරවාරි 28 දිනට එම ආයෝජන ගිණුමේ ශේෂය රු.16,407,211 ක්ව පැවතුණි. | අදාළ මුදලින් කොටසක් ආයතනයට බස් රථයක් මිලදී ගැනීමට සහ ආයතනයේ දේශන ශාලාවක් ඉදිකිරීම වෙනුවෙන් යොදවා ඇත. තවද ඉතිරි මුදල්ද ආයතනයේ පැරණි අර්ධ ස්ථිර ගොඩනැගිල්ලේ වැඩි දියුණු කිරීම් සඳහා මෙම වසර තුළ යොදා ගැනීමට සැලසුම් කර ඇති බව. | දේශීය වෛද්‍ය ආයතනයේ මාසික මුදල් අවශ්‍යතාවය සඳහා එම මුදල් යොදවා ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

2023 ජනවාරි 01 සිට 2023 පෙබරවාරි 28 දින දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා මෙහෙයුම් ප්‍රතිඵලය රු. 4,256,922 ක ඌනතාවයක් විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020, 2021 සහ 2022 වර්ෂවල දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආයුර්වේදය හා යුනානි පාඨමාලා හදාරන සිසුන් ආයතනය හැරයාමේ ප්‍රතිශතය සියයට 19 සිට සියයට 27.5 ක පරාසයක පැවතුණද ඒ සම්බන්ධයෙන් සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු කර නොතිබුණි. | 2020,2021, සහ 2022 වර්ෂවල දේශීය වෛද්‍ය පීඨයේ ආයුර්වේද සහ යුනානි හදාරන සිසුන් වෙනත් උපාධි පාඨමාලාවකට යොමු වීම, පෞද්ගලික හේතූන් මත උපාධි පාඨමාලාව අවලංගු කර ගැනීම, විභාග අසමත්වීම හේතුවෙන් ඊළඟ වසරට ලියාපදිංචිය අලුත් කර ගැනීමට නොහැකි වීම, විවිධ හේතූන් මත කනිෂ්ඨ ශිෂ්‍ය කණ්ඩායම් සමග උපාධි පාඨමාලාව හැදෑරීමට ඉල්ලීම නිසා උපාධි පාඨමාලාව අතහැරයාම සහ කල්ගැනීම සිදු වී ඇති බව. | දේශීය වෛද්‍ය විද්‍යා ආයතනයේ ආයුර්වේදය හා යුනානි පාඨමාලා හදාරන සිසුන් ආයතනය හැරයාමේ ප්‍රතිශතය අඩුකර ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගතයුතුය. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අවශ්‍යතාවය සැලකිල්ලට නොගෙන මිලදී ගැනීම හේතුවෙන් මිලදී ගෙන වසර 4 සිට වසර 12 ක් ඉක්මවූ භාවිතයට ගත නොහැකි රු 128,063ක් වටිනා රිබන් හා ටෝනර් විගණිත දිනය වූ 2023 අගෝස්තු 09 වනවිට ගබඩාවේ ඉතිරි වී තිබුණි. | අදාළ ටෝනර් වර්ග භාවිතයට ගනු ලබන බව. | අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මිලදී ගැනීම් සිදුකල යුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පිරිමැසුම් දායක තාක්ෂණය (NERD Technology) උපයෝගි කර ගනිමින් රු. මිලියන 50 ක උපරිම සීමාවකට යටත්ව රජයේ ආයතනවල ඉදිකිරීම් කටයුතුවලට අදාලව උපදේශනය, සැලසුම් කිරීම හා ඉදිකිරීම් කටයුතු ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානය වෙත පැවරීමට අදාළ 2017 අගෝස්තු 01 දිනැති අංක 17/1578/716/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය අනුව රු.42,588,255ක (බදු රහිත) ඇස්තමේන්තු වටිනාකමක් යටතේ මහල් තුනකින් යුත් ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා 2021 දෙසැම්බර් 20 දින ශ්‍රී ලංකා ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයට (NERDC) ඉදිකිරීම් පවරා තිබුණි. එම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු වැඩ සැලැස්ම අනුව ඉදිකිරීම් නිමකිරීමට දින 321ක් සැලසුම් කර තිබුණ ද දින 522ක් ගත කිරීම හේතුවෙන් මුළු ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවේ මිල විචලනය, රු. 26,607,210 ක් ඇතුලත්ව රු.68,821,252 ක් (බදු රහිත) ගෙවීම් කර තිබුණි. | එවකට රටේ පැවැති අස්ථාවර තත්ත්වය, රටේ පැවැති ආර්ථික තත්ත්වය, අරගලය යන අවස්ථා කිහිපයකදී ඇඳිරි නීතිය ක්‍රියාත්මක කිරීම, ඉදිකිරීම් සේවාවන්ට අවශ්‍ය භාණ්ඩ හිඟය හේතුවෙන් මේ ගිවිසුම අනුව හිමි දින 321 ක කාල දීර්ඝය දින 150 ඇතුළුව 2023 අප්‍රේල් 6 වන දින එම කාලය අවසන් කොට විශ්වවිද්‍යාලයට භාර දිය යුතුය. මේ අනුව එදිනට පසුව ගිවිසුම් ප්‍රකාරව ප්‍රමාද ගාස්තු අය කිරීමට කටයුතු යොදා ඇත. වැඩ නිම කර භාර දී ඇත්තේ 2023 මැයි මස 04 වන දින බව. | ඉදිකිරීම් කටයුතු කඩිනම් කර, ලබා ගත හැකි ආර්ථික වාසි ලබා ගැනීමට අවධානය යොමුකල යුතුය. |